00028

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය
අධ්‍යාපන පීඨය
ප්‍රාථමික අධ්‍යාපනය පිළිබඳ අධ්‍යාපනවේදී ගෞරව
උපාධි වැඩසටහන- 5 වන මට්ටම 2020/2021
අවසාන පරීක්ෂණය
**EPU5551 - ප්‍රාථමික අධ්‍යාපනය සඳහා අධ්‍යාපනයේ පදනම**
කාලය - පැය තුනයි. (03)

---

දිනය - 2023.02.12 වේලාව - පෙ.ව.09.30 - ප.ව.12.30 දක්වා

---

**1 වන කොටසේ සියළුම ප්‍රශ්නවලට ද 2 වන කොටසේ ඕනෑම ප්‍රශ්න තුනකට (03) ද පිළිතුරු සපයන්න.**

## I වන කොටස

01. අධ්‍යාපන සංකල්පය සංකීර්ණ වීමට ප්‍රධාන සාධක හතරක් (04) බලපාන බව අග්‍රාවෙල් (Aggrawel 2000) සඳහන් කර ඇත. එම ප්‍රධාන සාධක හතර **(04)** ලියන්න.

02. අධ්‍යාපනය (Education) සහ පුහුණුව (Training) අතර ඇති වෙනස කෙටියෙන් සාකච්ඡා කරන්න.

03. පෙරදිග සම්ප්‍රදායික අධ්‍යාපන දාර්ශනිකයින් තිදෙනෙකු **(03)** නම් කරන්න.

04. **'අධ්‍යාපනික දාර්ශනික මත පිළිබඳ අවබෝධය ප්‍රාථමික පාසල් ගුරුවරයෙකුට වැදගත් වේ.'** මෙම අදහස තහවුරු කිරීම සඳහා කරුණු පහක් **(05)** ඉදිරිපත් කරන්න.

05. 'අධ්‍යාපනය ළමයාගේ හැකියාවන්, අවශ්‍යතාවන් හා ලැදියාවන්ට අනුව ලබාදිය යුතු බව රූසෝ කියයි.' මෙම අදහස උදාහරණ තුනක් **(03)** ඇසුරෙන් පැහැදිලි කරන්න.

06. 'දිවි පැවැත්ම සඳහා ඉගෙනුම' යනු උගත් දේ ප්‍රායෝගික ජීවිතයේ දී භාවිත කිරීම වේ. උගත් දේ ප්‍රායෝගික ජීවිතයේ දී භාවිත කරන ආකාරය පරිසරය ආශ්‍රිත ක්‍රියාකාරකම් විෂයය ආශ්‍රයෙන් කෙටියෙන් පැහැදිලි කරන්න.

07. ප්ලේටෝ යෝජනා කළ විෂයමාලාවේ මූලික ලක්ෂණ තුන **(03)** ලියන්න.

08. **'සමාජානුයෝජනය'** යනු කුමක්දැයි පැහැදිලි කර සමාජානුයෝගී කාරක තුනක් **(03)** ලියන්න.

(ලකුණු 05 x 08 = 40)

## 2 වන කොටස

09. (i) සමාජීය දෘෂ්ටිකෝණයෙන් බලන විට අධ්‍යාපනය මගින් ඉටු කළයුතු කාර්යයන් **පහක් (05)** කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 10)

(ii) ගුරුවරයෙකු ලෙස ඔබ එම එක් එක් කාර්යයන් ඉටු වෙන පරිදි ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය සංවිධානය කරන ආකාරය පැහැදිලි කරන්න. (ලකුණු 10)

10. (i) මහත්මා ගාන්ධිතුමන්ගේ අධ්‍යාපන චින්තාවන්හි ප්‍රධාන ලක්ෂණ කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 10)

(ii) එම අදහස් වර්තමානයේ ප්‍රාථමික අධ්‍යාපන විෂයමාලාව හා ප්‍රාථමික ඉගැන්වීම් ක්‍රම සමග කෙතරම් ගැලපෙන්නේ දැයි උදාහරණ සපයමින් සාකච්ඡා කරන්න. (ලකුණු 10)

11. (i) වර්තමානයේ රටේ පවතින තත්තවය අනුව ඉගෙනුම් ක්‍රියාවලිය තුළ ශිෂ්‍යයා මුහුණ දෙනු ලබන ගැටලු **පහක් (05)** හඳුනාගෙන කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 10)

(ii) එම ගැටලු අවම කිරීම සඳහා ප්‍රාථමික අධ්‍යාපන ගුරුවරයෙකු වශයෙන් ඔබගේ යෝජනා ඉදිරිපත් කරන්න. (ලකුණු 10)

12. (i) අධ්‍යාපනය හා ආර්ථික සංවර්ධනය අතර සම්බන්ධතාව කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 10)

(ii) ආර්ථික සංවර්ධනයක් ඇතිවන පරිද්දෙන් අධ්‍යාපනය වෙනස් කළයුතු ආකාරය පිළිබඳව ඔබ කරන යෝජනා ඉදිරිපත් කරන්න. (ලකුණු 10)

13. (i) දරුවන් සමාජානුයෝජනය කිරීමේ දී දෙමාපියන්ට මුහුණ දීමට සිදුවන අභියෝග **තුනක් (03)** ඉදිරිපත් කරන්න. (ලකුණු 10)

(ii) සමාජානුයෝජනය ඉහළ නැංවීම සඳහා සමවයස් කණ්ඩායම්වල දායකත්වය පැහැදිලි කරන්න. (ලකුණු 10)

- හිමිකම් ඇවිරිණි. -